පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක එන්සීපී/2007/12

අංක:- එන්සීපී/සීඑස්/පීටී/ඒපී/10,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.
2007.11.30

ආණ්ඩුකාරවර ලේකම්,
පළාත් සභාවේ ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## 2007 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය

2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලය සතුව ඇති භාණ්ඩ පිළිබඳව මු.රෙ.756 ප්‍රකාරව සමීක්ෂණ කටයුතු සිදු කල යුතු වේ.

02. එබැවින් උක්ත කාර්යය සඳහා වගකිව යුතු නිලධාරීන් දෙදෙනෙකුගෙන් යුතු සමීක්ෂණ මණ්ඩල පත් කල යුතුය. අදාල සමීක්ෂණ මණ්ඩල 2007.12.15 දිනට ඔබ විසින් පත් කිරීමටත්, අදාල උපදෙස් සහ කාර්යයන් එම සමීක්ෂණ මණ්ඩලය වෙත පැවරීමටත්, කරුණාකර ක්‍රියා කරන්න.

03. ඔබ අමාත්‍යංශයේ /දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ සමීක්ෂණ මණ්ඩලයට වෙනත් අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක/කාර්යාලයක නිලධාරියකු හෝ දෙදෙනෙකු පත් කර ගැනීම කළයුතු වේ. තවද ගබඩා භාර නිලධාරීන් මේ සඳහා පත් නොකල යුතු අතර, කාර්මික භාණ්ඩ කිසිවක් අත්නම් ඒ පිළිබඳ දැනුමැති නිලධාරියෙකු ද මේ සඳහා පත් කර ගත යුතුය. මේ දෙදෙනා අතුරෙන් ජ්‍යෝෂ්ඨතම නිලධාරියා එහි සභාපති විය යුතුය.

04.  ඔබ ආයතනයේ 2007 වර්ෂය තුළ භාණ්ඩ මිලදී ගැනීමද කාර්යල පාවිච්චිය සඳහා ස්ථාවරව තබා ගැනීම සඳහා කුමන ආකාරයක හෝ භාණ්ඩ ලැබීම් ඇත්නම් ඒවාද සහිතව බඩු වට්ටෝරු පොත 2007.12.31 දිනට තුලනය කර හරි වැරදි බැලීමේ (සමීක්ෂණ) මණ්ඩලයට ඉදිරිපත් කළයුතු වේ.

05.  එසේම උක්ත සමීක්ෂණ මණ්ඩලයට බඩු වට්ටෝරු පොතේ ඇති සහ බඩු වට්ටෝරු පොත භාර නිලධාරියා අතේ ඇති භාණ්ඩ පිළිබඳව භෞතිකව පරීක්ෂා කර බලා යම් වෙනසක් ඇත්නම් එයද සහිතව භා.ග.ප. 66 ආකෘතියේ ද, සමීක්ෂණයේදී අනාවරණය වන පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ පිළිබඳ පොදු ආකෘති 47 පිටපත් 04 කින් යුතුව සම්පූර්ණ කර 2008 පෙබරවාරි 15 දිනට පෙර මට හා විගණකාධිපතිට ද පිටපතක් සහිතව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

06.  ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා අදාල සමීක්ෂණ මණ්ඩල පත් කිරිම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් පාලන විසින් කරනු ලබන අතර, ඒ සඳහා සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකින්ම වගකිවයුතු නිලධාරින් දෙදෙනෙකුගේ නම් හා තනතුරු මූලික වැටුප ද, සඳහන් කර 2007.12.08 දිනට පෙර එවීමට ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් කටයුතු කළ යුතුය.

07.මෙම චක්‍රලේඛය ලද බව කරුණාකර සනාථ කරන්න.

**(ඒ.තලාකොටුනගේ),**
ප්‍රධාන ලේකම් (වැ.බ),
උතුරුමැද පලාත.

පිටපත:-

1. විගණකාධිපති - දැ.පි
2. දිස්ත්‍රික් ලේකම්, අනුරාධපුරය - ඉහත 6 අනුව දැනගැනීම සඳහා.
3. අධ්‍යක්ෂක (අය වැය) - දැ. පි
4. අධ්‍යක්ෂක (අභ්‍යන්තර විගණන) - දැ. පි